# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 ජූලි මස 08 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.55 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ආනන්ද රංජිත් රූපසිංහ
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදේන විජේරත්න
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඩුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
ශ්‍රීනාත් පෙරේරා
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
උදාර රත්නායක
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එඩ්වඩ් ගුණසේකර
කේ.ඩී. ලාල්කාන්ත
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත
පෙරේරා මනෝ ගනේෂන්
රජිත හපුආරච්චිගේ
ලයනල් ජයසිංහ
ලලිත් වර්ණකුමාර
ශිරන්ත අමරසේකර
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සෙනල් වෙල්ගම
සුනිල් ජයමිණි
සුසිල් කිඳෙල්පිටිය

## 01. නිවේදන :

*i*

*"මෙම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස (එ.ජ.නි.ස. - ගම්පහ) සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාගේ පත්වීම 2014.06.23 වන දින සිටත්,*

*ගරු සභානායක ලෙස (එ.ජ.නි.ස.- කොළඹ) ඒ.ඩී. ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාගේ පත්වීම 2014.06.27 දින සිටත්,*

*පිළිගනු ලැබූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*ii*

*උපදේශක කාරක සභා :*

*"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා වෙනුවට, 2014.06.25 දින සිට ගරු ජී. නිහාල් ප්‍රේමශාන්ත මැතිතුමාව නම් කිරීම හා,*

*"විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජල පවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.06.25 දින සිට යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාව නම් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*iii*

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාව ඇතුළුව නව කාර්යාල සංකීර්ණය සඳහා මහල් පහළොවකින් යුක්ත ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් කටයුතු සිදු කරනු ලබන කාල සීමාව තුළ සභා රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ගරු මන්ත්‍රීවරුන්හට සිදු විය හැකි අපහසුතාවයන් හැකිතාක් දුරට අවම කර සභා රැස්වීම් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇති බව දැනුම් දෙන අතර, ඊට අදාළව ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*iv.*

*කාර්ය පටිපාටි රීති (සංශෝධන) පුස්තකය :*

*"IV හා V වන පළාත් සභාවලදී සාකච්ඡා කොට සකස් කරන ලදුව, 2011.08.04 දින ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යොමු කරන ලද කාර්ය පටිපාටි රීති (සංශෝධන) පුස්තකය පිළිබඳ තීරණය 2013.09.03 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අප වෙත එවා ඇති අතර, එහි 12 වන රීතියත්, 40 සහ 49 වන රීතියත් පිළිබඳව අපගේ අවධානය යොමු කොට ඇති බැවින් එකී ලිපිය සහ නව කාර්ය පටිපාටි පුස්තකය පිළිබඳ යළිත් විමසා බලා තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී පළාත් සභාවේ යෝජනාවක් මගින් එය කාර්ය පටිපාටි රීති කාරක සභාවට යොමු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.[1]*

[1] 2014.07.08 දින නිල වාර්තාව බලන්න.

## 02. **කාරක සභා වාර්තා:**

2014.06.17 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.54 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.35 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

## 03. **නොපැමිණ සිටීමේ අවසරය :**

*"ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය."*

අ.භා. 12.40 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා **[**යසපාල කෝරළගේ මහතා**]** මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා **[**සුනිල් විජේරත්න මහතා**]** මූලාසනාරූඪ විය.

## 04. **බස්නාහිර පළාතේ 2014 අංක .... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : පළමුවර කියැවීම**

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ***"****බස්නාහිර පළාතේ 2014 අංක .... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය****"*** *පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.*

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

***"****2010 අංක 02 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.****"*** *යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 05. **2014 අංක ..... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය : පළමුවර කියවීම.**

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ***"*** *බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .... දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය* ***"*** *පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලදී.*

***අනතුරුව හේමන්ත සමරකෝන් මහතා [සභා ලේකම්] විසින්,***

***එහි පූර්විකාව වූ,***

***"****බැංකුවක් විසින් කර ගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද ඊට ආනුෂාංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2001 අංක 03 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද, වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥා පනතේ විධිවිධානවලට අනුකූල වේ.****"*** *යනුවෙන් ප්‍රකාශ කරන ලදී.*

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ගරු සභාපතිතුමා විසින් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

*රීති අංක **107** යටතේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද රීති අත්හිටුවීමේ යෝජනාවට හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විසින් බෙදීමක් ඉල්ලූ බැවින් සීනුව නාද කිරීමෙන් අනතුරුව ඡන්දය විමසන අවස්ථාවේදී සභාවේ ඇති වූ නොසන්සුන්තාව මත සභාව අ.භා. **01.00** ට තාවකාලිකව අත්සිටු වූයෙන්, අ.භා. 01.12 ට යළිත් රැස්විය.*

*අනතුරුව,*
*අදාළ යෝජනාවට ඡන්දය විමසන විට සභාවේ යළිත් ඇති වූ නොසන්සුන්තාව මත,*

## 06. කල් තැබීම :

ගරු සභාපතිතුමා විසින් රීති අංක 11(1) ප්‍රකාරව සභාව කල් තබන ලදී.

*ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. **01.25** ට, **2014** ජූලි මස **22** වන දින පූ.භා. **09.30** වන තෙක් කල් ගියේය.*

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.07.08
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/08
Minuts 2014.07.08 - Hansard Section